# ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ

## *පිරිසිදු කිරීමේ සේවය සැපයීම් සඳහා අවශ්‍ය වන සේදුම්කාරක හා විෂබීජ නාශක රසායනික ද්‍රව්‍යය මිළදී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු සපයා ගැනීම*

## *2025/2026*

## ලංසු ලියවිලි

## මහ රෝහල , පේරාදෙණිය

## ප්‍රසම්පාදන අංකය - THP/AB/10/2025

සියළුම ලේඛන අනු අංක පිළිවෙළට ඇති බවට පරීක්ෂා කර බලා ලබා ගත යුතු වේ.

## 1. පොදු කරුණු

1. ලංසු විෂය පථය

1.1 මෙම ලංසු ලේඛනය මඟින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා සෞඛ්‍ය ආයතන සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ දී අවශ්‍ය වන සේදුම්කාරක හා විෂබීජ නාශක රසායනික ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු සපයා ගැනීම සිදු කරනු ලබයි. මෙම ලංසු ලේඛනය මඟින් සුදුසු ලංසු කරුවන් විසින් සැපයිය යුතු අවශ්‍යතා පිළිබඳව දක්වා ඇත.

1.2 මෙම ලංසු ලේඛනය පුරා:

(අ) "ලිඛිතව" යන යෙදුමෙන් අදහස් වන්නේ තැපෑලෙන් (විද්‍යුත් තැපෑලෙන් හැර) ලිඛිතව ( භාර ගත් බවට සහතික කිරීමත් සමඟ) සන්නිවේදනය කිරීම වේ.

(ආ) සන්ධර්භයට අවශ්‍ය නම් ‘‘තනි’’ යන්නෙන් ‘‘බහු’’ ප්‍රතිවිරුද්ධව යන්න අදහස් කෙරේ.

(ඇ) "දවස" යනුවෙන් දින දර්ශන දිනය අදහස් කෙරේ.

2. අරමුදල් මූලාශ්‍රය

2.1 මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සඳහා BDS හි නිශ්චිතව දක්වා ඇති මූලාශ්‍රය මගින් මුදල් සපයනු ලැබේ.

3. ආචාර ධර්ම, වංචා සහ දූෂණ

3.1 ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල පහත කාරණා වෙත ලංසුකරුවන්ගේ අවධානය යොමු කෙරේ.

ප්‍රසම්පාදන ක්‍රියාවන් හා සම්බන්ධ සියළුම පාර්ශවයන් එනම් සැපයුම්කරුවන් / කොන්ත්‍රාකරුවන් සහ නිලධරයන් විසින් මෙම ක්‍රියාවලිය තුළදී තදින්ම රහස්‍යභාවය රැක ගන්නා බවට ඔවුන් සහතික විය යුතුය.

ප්‍රසම්පාදන ක්‍රියාවක නියැළී සිටින නිලධරයන් තම බලතල අනිසි ලෙස පාවිච්චි නොකළ යුතුය. තමාට හෝ තමාගේ ළඟම පවුලේ සාමාජිකයන්ට හෝ ව්‍යාපාරික පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකදී තම තත්වය අනිසි ලෙස පාවිච්චි කරන යම් නිලධරයෙකු දූෂණ ක්‍රියාවල නියලී සිටින බවට සලකනු ලැබේ.

3.2 සේවායෝජකයා විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හා කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේදී ලංසුකරුවන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකයින් විසින් ඉහළම ආචාර ධර්ම පිළිපැදීම අවශ්‍ය බව දැනුවත් කළ යුතුය. මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමේදී,

(අ) ‘‘දූෂිත ක්‍රියාව’’ යන්නෙන් අදහස් වන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හෝ කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාවට බලපෑම් කිරීම සඳහා වටිනා යම් කිසිවක් සෘජුව හෝ වක්‍රව පිරිනැමීම, ලබා ගැනීම හෝ ඉල්ලීමයි.

(ආ) "වංචා පිළිවෙත" යන්නෙන් අදහස් වන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියකට හෝ කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සඳහා කරුණු වැරදි ලෙස නිරූපණය කිරීම හෝ මග හැරීමයි.

(ඇ) "කුමන්ත්‍රණකාරී පිළිවෙත" යන්නෙන් අදහස් වන්නේ, කෘතීම හෝ තරඟකාරී නොවන මට්ටම් වල ලංසු මිල ස්ථාපිත කිරීම සඳහා සේවායෝජකයාගේ අනුදැනුම ඇතිව හෝ නැතිව ලංසුකරුවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

(ඈ) "බලහත්කාරී පිළිවෙත" යනු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සහභාගීත්වයට බලපෑම් කිරීම හෝ කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සඳහා පුද්ගලයන්ට හෝ ඔවුන්ගේ දේපළවලට සෘජුව හෝ වක්‍රව තර්ජනය කිරීම හෝ හානි කිරීමය.

3.3 ITB වගන්තිය 3.2 යටතේ නියම කර ඇති පරිදි, ලංසුකරුවෙකු සෘජුව හෝ නියෝජිතයෙකු මාර්ගයෙන් දූෂිත, වංචනික, කුමන්ත්‍රණකාරී හෝ බලහත්කාර ක්‍රියාකාරකම්වල නියැලී සිටින බව අනාවරණය වුවහොත්, සේවායෝජකයා විසින් ලංසුව ප්‍රතික්ෂේප කරනු ඇත.

4. සුදුසුකම්ලත් ලංසුකරුවන්

4.1 මෙම කොන්ත්‍රාත්තුව යටතේ සේවා සැපයීම සඳහා සියලුම ලංසුකරුවන්ට නීත්‍යානුකූල අයිතිය ඇත.

4.2 ලංසු තබන්නෙකුට සම්බන්ධතා අතර අනුකූලතාව නොතිබිය යුතුය. සම්බන්ධතා අතර අනුකූලතාවයක් ඇති බව සොයා ගන්නා ලද සියලුම ලංසුකරුවන් නුසුදුස්සන් කරනු ලැබේ. පහත සඳහන් අවස්ථාවලදී ලංසුකරුවන්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ එක් පාර්ශවයක් හෝ කිහිපයක් සමඟ සම්බන්ධතා අතර අනුකූලතාවයක් ඇති බව සැලකිය හැකිය,ඒවා නම්:

(අ) ප්‍රසම්පාදනය සඳහා භාවිතා කළ යුතු සැලසුම්, පිරිවිතර ලංසු ලියවිලි සහ වෙනත් ලියකියවිලි සකස් කිරීම සඳහා උපදේශන සේවා සැපයීම සඳහා සේවායෝජකයා විසින් නියැලී සිටින සමාගමක් හෝ එහි අනුබද්ධ ආයතනයක් සමඟ සම්බන්ධ වීම හෝ සම්බන්ධ වී තිබීම හෝ

(ආ) මෙම ලංසු තැබීමේ ක්‍රියාවලියේදී ලංසු එකකට වඩා ඉදිරිපත් කිරීම. නමුත් මෙය එක් ලංසුවකට වඩා උප කොන්ත්‍රාත්කරුවන්ගේ සහභාගීත්වය සීමා නොකරයි.

4.3 ලංසු ඉදිරිපත් කරන දිනයේ හෝ කොන්ත්‍රාත් ප්‍රදානය කරන දිනයේදී මුදල් අමාත්‍යාංශය විසින් හෝ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් අසාධු ලේඛනගත කර ඇති ලංසුකරුවන් නුසුදුස්සන් වනු ඇත.

4.4 විදේශීය ලංසුකරුට ලංසුවක් ඉදිරිපත් කළ හැක්කේ ලංසු දත්ත සටහනේ එසේ සඳහන් කර ඇත්නම් පමණි.

5. ලංසු තැබීමේ පිරිවැය

5.1 ලංසුකරු තම ලංසුව සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ සියලු වියදම් දැරිය යුතු අතර, සේවායෝජකයා කිසිදු අවස්ථාවක එම වියදම් සඳහා වගකිව යුතු හෝ වගකිව යුතු නොවේ.

6. පූර්ව ලංසු රැස්වීම

6.1 ලංසුකරුට සේවය සැපයීම අවශ්‍ය වන ස්ථානය පරීක්ෂා කිරීමට හා ලංසුව සකස් කිරීමට අවශ්‍ය සියලු තොරතුරු සපයා ගැනීම සඳහා ත් පූර්ව ලංසු රැස්වීම පවත්වනු ලැබේ. පූර්ව ලංසු රැස්වීම සඳහා සහභාගි වීමේ පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතු වේ.

පූර්ව ලංසු රැස්වීම පැවැත්වීම පහත පරිදි කාලසටහන්ගත කර ඇත.

ස්ථානය : මහ රෝහල, පේරාදෙණිය

දිනය : 2025.10.29

**7.** ලංසු ප්‍රදානය පිළිබඳ දැනුම්දීම

7.1 ලංසු වලංගු කාලය අවසන් වීමට පෙර, සේවායෝජකයා විසින් සාර්ථක ලංසුකරුට ලංසුව පිළිගෙන ඇති බව ලිඛිතව දැනුම් දිය යුතුය.

7.2 විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් සකස් කර ක්‍රියාත්මක කරන තුරු, ප්‍රදානය කිරීමේ දැනුම් දීම බැඳීම් කොන්ත්‍රාත්තුවක් විය යුතුය.

7.3 සාර්ථක ලංසුකරු විසින් අත්සන් කරන ලද කොන්ත්‍රාත් පෝරමය සහ අනුකූලව කාර්ය සාධන සුරක්ෂණය ලබා දීමෙන් පසු, සේවා යෝජකයා විසින් එක් එක් අසාර්ථක ලංසුකරුට වහාම දැනුම් දෙන එහි ලංසු සුරක්ෂණය මුදා හරිනු ඇත.

8. අභියාචනා ඉදිරිපත් කිරීම.

8.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 අනුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණය එනම් සාර්ථක ලංසුකරුවෙකු තෝරා ගෙන ඔහු වෙත ලංසුව පිරිනැමීමේ අභිලාෂය සියලු ලංසුකරුවන් වෙත වෙන් වෙන්ව ලිඛිතව දැනුම් දෙන අතර ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවෙහි නිර්දේශයන්ට එරෙහිව අභියාචනා කිරීමට අවශ්‍ය වේ නම් දැනුම් දී දින 07 ක් ඇතුලත ප්‍රාදේශීය ප්‍රසම්පාදන අභියාචනා කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කල හැකිය. සෑම අභියාචනාවක් සමඟ ම ආපසු නොගෙවන රු.2500.00 ක මුදලක් පේරාදෙණිය මහ රෝහලේ සරප් වෙත ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ මුල් පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය.

කුවිතාන්සියේ මුල් පිටපත සමඟ නියමිත කාලය තුළ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.

9. කොන්ත්‍රාත්තුව අත්සන් කිරීම

9.1 දැනුම් දීමෙන් පසු දින දාහතරක් (14) ඇතුළත, සේවායෝජකයා ගිවිසුම සම්පූර්ණ කර, එය අත්සන් කරන ලෙස සාර්ථක ලංසුකරුට දැනුම් දිය යුතුය.

9.2 එවැනි තොරතුරු ලැබීමෙන් දින දාහතරක් (14) ඇතුළත, සාර්ථක ලංසුකරු ගිවිසුම අත්සන් කළ යුතුය.

9.3 නියමිත කාලය තුළ ගිවිසුම් අත්සන් කිරීමට තෝරාගත් ලංසුකරු අපොහොසත් වුවහොත් ප්‍රතිචාරාත්මක ඊලග ලංසුකරු වෙත ලංසුව පිරිනැමීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ .

10. කාර්ය සාධන සුරක්ෂණය

10.1 සේවායෝජකයාගෙන් කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ දැනුම්දීම ලැබීමෙන් දින දාහතරක් (14) ඇතුළත, අවශ්‍ය නම් සාර්ථක ලංසුකරු විසින් VII වන කොටසෙහි දැක්වෙන කොන්ත්‍රාත් ආකෘති පත්‍රවල ඇතුළත් කාර්ය සාධන සුරක්ෂණය පෝරමය භාවිතා කරමින්, ලංසු කොන්දේසිවලට අනුකූලව කාර්ය සාධන සුරක්ෂණය සැපයිය යුතුය. සේවායෝජකයා විසින් ජයග්‍රාහී ලංසුකරුගේ නම එක් එක් අසාර්ථක ලංසුකරු වෙත කඩිනමින් දැනුම් දිය යුතු අතර අසාර්ථක ලංසුකරුවන්ගේ ලංසු සුරැකුම්පත් නිකුත් කළ යුතුය.

10.2 සාර්ථක ලංසුකරු ඉහත සඳහන් කාර්ය සාධන සුරක්ෂණය ඉදිරිපත් කිරීමට හෝ කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට අපොහොසත් වීම ලංසු ප්‍රදානය අවලංගු කිරීමට සහ ලංසු සුරක්ෂණය අහිමි කිරීමට හෝ ලංසු සුරක්ෂණ ප්‍රකාශය අහිමි කිරීමට ප්‍රමාණවත් හේතු වේ. එම අවස්ථාවෙහිදී සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ හැක්කේ ඊළඟ අඩුම ඇගයීමට ලක් වූ ලංසුකරුට වන අතර, ඔහුගේ පිරිනැමීම සැලකිය යුතු ලෙස ප්‍රතිචාර දක්වන අතර කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කිරීමට සුදුසුකම් ලැබීමට සේවායෝජකයා විසින් තීරණය කරනු ලැබේ.

## 2. ලංසු දත්ත පත්‍රිකාව (BDS)

ප්‍රසම්පාදනය කළ යුතු සේවා හා භාණ්ඩ සඳහා පහත සඳහන් නිශ්චිත දත්ත අනුපූරක, අතිරේක,හෝ ලංසුකරුවන්ට උපදෙස් (ITB) හි විධිවිධාන සංශෝධනය විය යුතුය. සෑම විටම මෙහි ඇති විධිවිධාන ලංසුකරුවන් සඳහා වන උපදෙස් (ITB) හි ඇති විධිවිධානවලට අනනුකූල වන්නේ නම් මෙහි විධිවිධාන බලපැවැත්විය යුතුය.

| | |
|---|---|
| **පොදු** | |
| සේවා යෝජකයා: | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි |
| කොන්ත්‍රාත්තුවේ නම : පිරිසිදු කිරීමේ සේවය සැපයීම් සඳහා අවශ්‍ය වන සේදුම්කාරක හා විශබීජ නාශක රසායනික ද්‍රව්‍යමිළදී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු සපයා ගැනීම- 2025/2026<br><br>හඳුනාගැනීමේ අංකය : THP/AB/10/2025 | |
| අරමුදල් ප්‍රභවය :ශ්‍රී ලංකා ජනරජයේ අරමුදල | |
| **B. ලංසු තැබීමේ ලේඛනවල අන්තර්ගතය** | |
| ලංසු අරමුණු පැහැදිලි කිරීම සඳහා පමණක්, සේවා යෝජකයාගේ ලිපිනය වන්නේ:<br><br>අවධානය : අධ්‍යක්ෂ<br><br>ලිපිනය : මහ රෝහල, පේරාදෙණිය<br><br>දුරකථන : 081-2388001<br><br>ෆැක්ස් අංකය: 081-2388371<br><br>විද්‍යුත් තැපැල් ලිපිනය: perahospital@gmail.com | |
| **C. ලංසු සකස් කිරීම** | |
| ලංසුකරු විසින් පහත ලේඛන වල මුද්‍රිත පිටපත් ඉදිරිපත් කළ යුතුය.<br><br>a) පිරිසිදු කිරීමේ සේවාව සඳහා යොදාගන්නා සේදුම්කාරක හා විෂබීජ නාශක රසායනික ද්‍රව්‍ය නිශ්පාදනය කිරීම හෝ සැපයීම සඳහා ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය (සහතික කළ පිටපතක්) (ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත හෝ 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ ආයතනයක් ලෙස ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.). පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය ආනයනය කරන්නේ නම් අදාළ ආයතනයේ නියෝජිතයෙකු ලෙස කටයුතු කරනු ලබන බවට මව් ආයතනයෙන් නිකුත් කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය. | |

| | |
|---|---|
| b) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් පිරිසිදු කිරීම සඳහා භාවිතා කරනු ලබන රසායන ද්‍රවය නිෂ්පාදනය කිරීමට අදාළ GMP (Good Manufacturing Practices) සහතිකය<br><br>c) ලංසුකරු නිෂ්පාදකයකු නොවන්නේ නම් එම නිෂ්පාදකයාගේ වෙළඳ නියෝජිතයකු බවට ලංසුකරු පිළිගන්නා බවට වු සහතිකය සමඟ a හා b කරුණු වලට අදාළ සහතික ඉදිරිපත් කල යුතුය.<br>d) සපයනු ලබන සියලුම රසායනික ද්‍රව්‍ය සඳහා ITI මඟින් හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ලබාගන්නා ලද තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දිය යුතුයි. එම රසායනික ද්‍රව්‍යවල ප්‍රමිතිය අංක වගු අංක 03 යටතේ දක්වා ඇති ප්‍රමිතියන්ට අනුකූල විය යුතුයි.<br>e) රසායනික ද්‍රව්‍යවල විස්තර ඇතුළත් දත්ත පත්‍රිකා (Product Brochures)<br><br>f) සපයනු ලබන රසායනික ද්‍රව්‍යවලට අදාළ Material Safety Data Sheets ලබා දිය යුතුය.<br><br>g) ලංසුකරුගේ ප්‍රකාශය<br>h) ලංසු සුරක්ෂණය ( මුදලින් ගෙවන්නේ නම් අදාල මුදල පේරාදෙණිය මහ රෝහලේ සරප් වෙත ගෙවා කුවිතාන්සියේ මුල් පිටපත ඉදිරිපත් කර තිබිය යුතුය.)<br><br>i) VAT බදු ලියාපදංචි සහතිකයේ පිටපතක් (VAT බදු සඳහා ලියාපදිංචි වී නොමැති බවට සහතිකයක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.) සමඟ අදාළ තක්සේරු වර්ෂයේ VAT බදු ගෙවීම් පිළිබඳ වැට් බදු නිශ්කාෂණ සහතික පිටපත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියකු විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.<br><br>j) ලංසුව ඉදිරිපත් කරනු ලබන්නේ හවුල් ව්‍යාපාර නාමයකින් හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමකින් නම්, ලංසු අයදුම්පත, ලංසු කොන්දේසි, ගිවිසුම ඇතුළු මෙම ප්‍රසම්පාදනයට අදාළ සියලු කටයුතු සඳහා වන බලය පැවරීමේ ලේඛනයක්<br><br>k) පසුගිය වර්ෂවල 10ක් ඇතුලත රෝහල්වල ආයතන ප්‍රධානියා හෝ බලය පැවරූ නිලධාරියෙකුගෙන් රසායනික ද්‍රව්‍ය සැපයීමට අදාළව ලංසුකරු සම්බන්ධයෙන් ලැබී ඇති සේවා වාර්තා<br><br>l) මෙම කොන්ත්‍රාත්තුවට අදාළ නොකඩවා රෝහල් වලට රසායනික ද්‍රව්‍ය අවශ්‍යතාවය සැපයිය හැකි බවට ලංසුකරුගේ දිවුරුම් ප්‍රකාශයක්.<br><br>m) පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය (මුල් පිටපත) ඒ ඒ රෝහල සඳහා වෙන වෙනම ලියාපදිංචි සහතික ඉදිරිපත් කළ යුතුය. | |
| ලංසුකරු විසින් සියලු වියදම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්විය යුතුය. | |
| ලංසුවේ වලංගු කාලය, ලංසු විවෘත කරන දින (2025.10.07) සිට දින 91ක් (2026.02.05) දක්වා වලංගු විය යුතුය. | |

| | |
|---|---|
| ලංසු ආකෘති පත්‍රවල III කොටසෙහි ඇතුලත් ආකෘති පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද ලංසු සුරැකුමක් ඇතුළත් විය යුතුය. මෙම ලංසු සුරැකුම මුදල් ඇපකරයක් මගින්ද ඉදිරිපත් කළ හැක. ලංසු සුරක්ෂණය **අධ්‍යක්ෂ, මහ රෝහල, පේරාදෙණිය** නමට ඉදිරිපත් කල යුතුය. | |
| ලංසු සුරක්ෂණය **රු.120,000.00** ක වටිනාකමින් යුක්ත විය යුතුය.<br><br>ලංසු සුරක්ෂණයේ වලංගු කාලය **2025.10.07** දින සිට **2026.03.05** දින දක්වා විය යුතුය. | |
| **D. ලංසු ඉදිරිපත් කිරීම සහ විවෘත කිරීම** | |
| ඇතුළත සහ පිටත ලියුම් කවරවල රෝහල්/ආයතනයට අදාළ නම සහ ප්‍රසම්පාදන අංකය සටහන් කළ යුතුය. | |
| ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය**: 2025.11.07**<br><br>වේලාව**: පෙ.ව 10.30** | |
| ලංසු ඉදිරිපත් කිරීම සඳහා, සේවායෝජකයාගේ ලිපිනය වන්නේ:<br><br>අවධානය : අධ්‍යක්ෂ<br><br>ලිපිනය : මහ රෝහල, පේරාදෙණිය | |
| ලංසු විවෘත කිරීම සිදු වන්නේ:<br><br>ලිපිනය : දේශන ශාලා අංක 01, මහ රෝහල, පේරාදෙණිය<br><br>**දිනය : 2025.11.07**<br><br>**වේලාව : පෙ.ව 10.30** | |
| **E. ලංසු ඇගයීම සහ සංසන්දනය** | |
| ඇගයීම සඳහා පහත සඳහන් සාධක සහ ක්‍රමවේදය භාවිතා කරනු ඇත:<br><br>1. ඉහත C කොටසෙහි අංක a සිට h හි දැක්වෙන සියලුම ලේඛන නොඅඩුව ඉදිරිපත් කළ යුතු අතර ඉන් එකක් හෝ ඉදිරිපත් කර නොමැති ලංසු සම්බන්ධයෙන් ගනු ලබන අවසාන තීරණය ප්‍රසම්පාදන කමිටුවේ තීරණය වේ. තවද i සිට l දක්වා වන සෙසු ලේඛන මූලික ලංසු ඇගයීමේදී ඉදිරිපත් නොකිරීම සුළු අපගමනයන් (Minor deviation) ලෙස සළකනු ලැබේ.කෙසේ වෙතත් අවසන් ඇගයීමේදී ඉදිරිපත් කර ඇති සියළු ලේඛන පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ. | |

| | |
|---|---|
| 2. ලංසු ඉදිරිපත් කළ ආයතනයන්ට එරෙහිව රෝහල්/ආයතනයන්හි දෛනික කටයුතුවලට දැඩි බලපෑමක් එල්ල වන ආකාරයේ පැමිණිල්ලක් හෝ පැමිණිලි ලැබී තිබේ නම් එය පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවේ දී ප්‍රතිචාරාත්මක ලංසුකරුවෙක් ලෙස නොසැළකීමට හේතුවක් වේ. | |
| **කාර්ය සාධන සුරක්ෂණය** | |
| ලංසු ප්‍රදානය ලද කොන්ත්‍රාත්කරු, ලංසු පිළිගැනීමේ ලිපිය ඉදිරිපත් කර දින 14ක් ඇතුළත ලංසුවේ කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 10%ක් හෝ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය අනුව දැනුම් දෙනු ලබන වටිනාකමින් යුත් කාර්යසාධන බැඳුම්කරයක්, මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබා ගෙන අධ්‍යක්ෂ, මහ රෝහල, පේරාදෙණිය නමට ඉදිරිපත් කළ යුතුය | |

**3. <u>රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා අදාළ පිරිවිතරයන්</u>**

| අනු අංකය | රසායන ද්‍රව්‍ය | අදාළ පිරිවිතර **(Relevant Standard)** | අයිතමය | පිරිවිතර සීමාවන් |
|---|---|---|---|---|
| 01 | Multi-Purpose Cleaner/ Liquid Detergent<br>රෝහලේ/ ආයතනයේ පොළව පිරිසිදු කිරීම සඳහා | SLS 687 | 1.Active ingredient content | 12% minimum |
| | | | 2.PH at 27 + 2 0C | 6.5 – 9.0 |
| | | | 3.Solubility | Satisfactory |
| | | | 4.Rinsing Properties | Satisfactory |
| | | | 5.Total Non – detergent organic matter | 0.5% Max. |
| | | ASTM E 2783 | 6. Microbiological Efficacy | 99% |
| 02 | හයිඩ්‍රොක්ලෝරින්/ෆයිනෝල් / ෆීනෝල්<br>නානකාමර/ වැසිකිළි පොළව පිරිසිදු කිරීම සඳහා | ASTM E 2783 | 1.Microbiological Efficacy | 99% |
| | | SLS 687 | 2. PH | 6.5 – 9.0 |
| 03 | Disinfectant Cleaner<br>නානකාමර/ වැසිකිළි පිරිසිදු කිරීම සඳහා | ASTM E 2783 | 1.Microbiological Efficacy | Pass/ 99% |
| | | PH 687 | 2. PH | 6.5 – 9.0 |
| 04 | බ්ලීචින් පවුඩර් (Bleaching Powder)<br>කාණු වැනි ස්ථාන පිරිසිදු කිරීම සඳහා | SLS 759 Appendix C | 1.Available Chlorine | 35 (min) |
| | | SLS 759 Appendix D | 2.Loss of Available Chlorine | 6.5% (Max.) |
| | | SLS 759 Appendix F | 3.Particle Size (1.40mm) | 99.5% (Min.) |
| | | SLS 759 Appendix G | 4.Bulk Density | 0.8 g/ml (Min.) |
| 05 | | SLS 1657 | 1.PH | 5.0 – 7.5 |

| | | | | |
|---|---|---|---|---|
| | සුවඳ දියර/එයාර් ප්‍රෙෂ්නර් | | 2.Presence or absence of Ethanol | Absence |
| 06 | ටයිල් ක්ලීනර්<br>ටයිල් සහිත ස්ථාන පිරිසිදු කිරීම සඳහා | IS 14364 | 1.Color | Satisfactory |
| | | | 2.Odor | Satisfactory |
| | | | 3.Stability | Satisfactory |
| | | | 4.Total non-volatile matter | 4.0 (Min) |
| | | | 5.PH | 5.0 – 7.0 |
| | | | 6.QAC/AI Content | 0.50 (Min) |
| | | ASTM E 2783 | 7. Microbiological Efficacy | 99% |
| 07 | Toilet Bowl Cleaner<br>වැසිකිළි පිරිසිදු කිරීම සඳහා | SLS 687 | 1.Rinsing Properties | Satisfactory |
| | | | 2.Solubility | Satisfactory |
| | | IS 7983 | 3.HCl content | 7.0% -10.0% |
| | | ASTM E 2783 | 4.Microbial Efficacy | 99% |
| 08 | Glass Cleaner | IS 14364 | 1.Active ingredient content | 12% minimum |
| | | SLS 687 | 2.PH at 27 + 2 0C | 6.5 – 9.0 |
| | | | 3.Solubility | Satisfactory |
| | | | 4.Rinsing Properties | Satisfactory |
| | | | 5.Total Non – detergent organic matter | 0.5% Max. |
| | | ASTM E 2783 | 6. Microbiological Efficacy | 99% |

## 4. රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ප්‍රමාණ පත්‍රය

| අනු අංකය | රසායනික ද්‍රව්‍යය | වෙළඳ නාමය/ සන්නාම නාමය | ඒකකය | ඒකක ගණන (වාර්ෂික) | ඒකකයක මිළ | මුළු මිළ |
|---|---|---|---|---|---|---|
| 01 | Multi-Purpose Cleaner/ Liquid Detergent | | Litre | 4,200 | | |
| 02 | හයිඩ්‍රොක්ලෝරින්/ෆයිනෝල්/ ෆීනෝල් | | Litre | 3,600 | | |
| 03 | ග්ලාස් ක්ලීනර් (Glass Cleaner) | | Litre | 60 | | |
| 04 | බ්ලීචින් පවුඩර් (Bleaching Powder | | Litre | 180 | | |
| 05 | සුවඳ දියර/එයාර් ෆ්‍රෙෂ්නර් | | Litre | 1,200 | | |
| 06 | ටයිල් ක්ලීනර් | | Litre | 96 | | |
| 07 | Toilet Bowl Cleaner | | Litre | 2,400 | | |
| 08 | මොත් බෝල් (Moth Ball) | | 500mg පැකට් | 12 | | |
| 09 | සුවඳ කැට | | කැට | 120 | | |
| | මුළු මුදල | | | | | |

## 5. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි

### 1. සාමාන්‍ය විධිවිධාන

### 1.1 අර්ථ දැක්වීම්

(අ) "ක්‍රියාකාරකම් සටහන" යනු මෙම ලංසුවේ කොටසක් වන සේවා සපයන්නා විසින් ඉදිරිපත් කළ යුතු සේවා අයිතම වල මිල කළ සහ සම්පූර්ණ කරන ලද ලැයිස්තුවකි.

(ආ) "සම්පූර්ණ කිරීමේ දිනය" යන්නෙන් අදහස් කරන්නේ සේවා යෝජකයා විසින් සහතික කරන ලද, සේවා සපයන්නා විසින් සම්පූර්ණ කරන දිනයයි.

(ඇ) "කොන්ත්‍රාත්තුව" යනු පාර්ශවකරුවන් විසින් මෙම කොන්ත්‍රාත් ගිවිසුමෙහි ගිවිසුම් ගත වන කොන්දේසි සහ අංක 01හි සඳහන් සියලුම ලියවිලි ඇතුළත්ව අත්සන් කරන ලද කොන්ත්‍රාත්තුවයි.

(ඇ) "කොන්ත්‍රාත් මිල" යන්නෙන් අදහස් වන්නේ මෙහි 6 වන වගන්තියට අනුව සේවා ඉටු කිරීම සඳහා ගෙවිය යුතු මිලයි.

(ඉ) සේවායෝජකයා යනු, සේවා සපයන්නාව සේවයේ යොදවන පාර්ශවයයි.

(ඊ) "පාර්ශවය" යන්නෙන් අදහස් කරන්නේ සේවායෝජකයා හෝ සේවා සපයන්නාය. "පාර්ශවයන්" යන්නෙන් අදහස් කරන්නේ ඒ දෙපාර්ශවයමයි.

(උ) "පුද්ගලයින්" යන්නෙන් අදහස් වන්නේ සේවා සපයන්නා විසින් සේවකයන් ලෙස කුලියට ගන්නා ලද සහ සේවාවන්හි කාර්ය සාධනය සඳහා හෝ එහි කිසියම් කොටසක් ඉටු කිරීමට පැවරූ පුද්ගලයන්ය.

(ඌ) "සේවා සපයන්නා" යනු සේවායෝජකයා විසින් සේවා සැපයීමේ ලංසුව පිළිගෙන ඇති පුද්ගලයෙකු හෝ ආයතනයකි.

(එ) "සේවා සපයන්නාගේ ලංසුව" යනු සේවා සපයන්නා විසින් සේවායෝජකයා වෙත ඉදිරිපත් කරන සම්පූර්ණ කරන ලද ලංසු ලේඛනයයි.

(ඒ) "සේවායෝජකයාගේ අවශ්‍යතා" යන්නෙන් අදහස් වන්නේ සේවා සපයන්නා විසින් සේවා යෝජකයා වෙත ඉදිරිපත් කරන ලද ලංසු ලේඛනයේ ඇතුළත් සේවාවේ සේවායෝජකයාගේ අවශ්‍යතාවය වේ.

(ඔ) "සේවා" යනු මෙම කොන්ත්‍රාත්තුවට අනුව සේවා සපයන්නා විසින් ඉටු කළ යුතු කාර්යය සහ සේවායෝජකයාගේ අවශ්‍යතාවය සහ සේවා සපයන්නාගේ ලංසුවට ඇතුළත් ක්‍රියාකාරකම් වේ.

### 1.2 අදාළ නීතිය

කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට අනුකූල විය යුතුය.

### 1.3 භාෂාව

මෙම කොන්ත්‍රාත්තුව සිංහල හා දෙමළ භාෂා වලින් ක්‍රියාත්මක වනු ඇත.
පාඨ අතර අනනුකූලතාවයක් මතු වුවහොත් සිංහල භාෂාවෙන් සඳහන් පාඨ බලපැවැත් වේ.

## 1.4 දැනුම්දීම්

මෙම කොන්ත්‍රාත්තුවට අනුව කරන ලද යම් දැනුම්දීමක්, ඉල්ලීමක් හෝ කැමැත්තක් සන්නිවේදනය ආමන්ත්‍රණය කරන ලද පාර්ශවයේ බලයලත් නියෝජිතයකුට පෞද්ගලිකව භාර දුන් විට හෝ ලියාපදිංචි තැපෑලෙන් යවන විට එය කොන්ත්‍රාත් දත්තවල දක්වා ඇති ලිපිනවලට යැවූ බවට ලිඛිතව තිබිය යුතුය.

## 1.5 ස්ථානය

සේවායෝජකයා විසින් අනුමත කරන ලද ස්ථානය හෝ ස්ථානවල සේවා සිදු කළ යුතු වේ. නිශ්චිත වශයෙන් ස්ථානයක් සඳහන් නොමැති අවස්ථාවලදී සේවායෝජකයා විසින් අනුමත කරන පරිදි ඉටු කළ යුතු වේ.

## 1.6 බලයලත් නියෝජිතයන්

මෙම කොන්ත්‍රාත්තුව යටතේ සේවායෝජකයා හෝ සේවා සපයන්නා විසින් අවශ්‍ය හෝ අවසර ගැනීමට දී ඇති ඕනෑම ක්‍රියාමාර්ගයක් සහ අවශ්‍ය හෝ ක්‍රියාත්මක කිරීමට අවසර දී ඇති ඕනෑම ලියවිල්ලක් ක්‍රියාත්මක කළ හැකි කොන්ත්‍රාත් දත්ත වල දක්වා ඇති නිළධාරින් වේ

## 2. කොන්ත්‍රාත් කාල සීමාව තුළ කොන්ත්‍රාත්කරු විසින් අවධානය යොමු කළ යුතු කරුණු

2.1 කොන්ත්‍රාත්කරු විසින් මේ කොන්ත්‍රාත්තුව යටතේ තම අයිතිවාසිකම් වෙන කිසිම කෙනෙකුට පැවරීම හෝ අතුරු බද්දක් වශයෙන් දීම හෝ නොකළ යුතු අතර, ඒ සඳහා ඔහුට කිසිම බලයක් නොමැත. රසායනික ද්‍රව්‍ය සැපයීමේ සේවය අසතුටුදායක බව පෙනී ගියහොත් ඕනෑම අවස්ථාවක, මාසයක දැනුම්දීමකින් සේවය නතර කිරීම හා නැවත ටෙන්ඩර් කැඳවීමට හෝ වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත. රසායනික ද්‍රව්‍ය සැපයීමේ කොන්ත්‍රාත්කරු විසින් තම සේවය ඉල්ලා අස්කර ගන්නේ නම් මාස තුනක කාලයකට ප්‍රථම ඒ බව ආයතන ප්‍රධානියා මඟින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ට දැන්විය යුතුය.

2.2 රෝහල/සෞඛ්‍ය ආයතනය විසින් පූර්වයෙන් නිශ්චය කරනු ලබන දිනයෙදි කොන්ත්‍රාත්කරු විසින් රසායනික ද්‍රව්‍ය රෝහල/ සෞඛ්‍ය ආයතනය වෙත ප්‍රවාහනය කර භාර දිය යුතුය.

2.3 රසායනික ද්‍රව්‍ය සැපයීමේ සේවය පරීක්ෂා කිරීමේ බලය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරින් ද සැපයුම්කාර ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ බලය පැවරූ වෙනත් නිලධාරියෙකු සතු වේ. ඔවුන් කලින් කලට සේවයේ අවශ්‍යතාවය මත දෙනු ලබන උපදෙස් හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට සේවා සැපයුම්කරු බැඳී සිටී. අදාළ උපදෙස් හා නියෝග ලිඛිතව ලබා දෙනු ඇත.

2.4 සේවා සැපයීම හා ඒ හා සම්බන්ධ තත්ත්වයන් අසතුටුදායක නම් අදාළ සේවා සැපයුම්කරුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත. එමෙන්ම එයට යටත්වීමට ලංසුකරු බැඳී සිටියි.

2.5 සාර්ථක ලංසුකරු ගිවිසුම මඟින් සැපයීමට එකඟ වූ සේවා නොඅඩුව සහ පරිපූර්ණව සැපයිය යුතුය.

**3. කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීම, සම්පූර්ණ කිරීම, වෙනස් කිරීම සහ අවසන් කිරීම.**

**3.1 කොන්ත්‍රාත්තුව බලාත්මක වීම**

කොන්ත්‍රාත්තුව පාර්ශවකරුවන් විසින් අත්සන් කරන ලද දිනය හෝ කොන්ත්‍රාත් දත්තවල සඳහන් වන වෙනත් පසුකාලීන දිනයක සිට කොන්ත්‍රාත්තුව බලාත්මක වන්නේය.

**3.2 ආරම්භක දිනය**

සේවා සපයන්නා විසින් කොන්ත්‍රාත්තුව බලාත්මක වන දින සිට දින 07ක් තුළ හෝ කොන්ත්‍රාත් දත්තවල සඳහන් වෙනත් දිනකදී සේවා සිදු කිරීම ආරම්භ කළ යුතුය.

**3.3 කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය**

3.7 වගන්තියට අනුව කොන්ත්‍රාත්තුව අවසන් නොකළේ නම්,කොන්ත්‍රාත් දත්තවල දක්වා ඇති පරිදි සේවා සපයන්නා අපේක්ෂිත අවසන් දිනයට ක්‍රියාකාරකම් සම්පූර්ණ කළ යුතුය. මෙම අවස්ථාවේදී සම්පූර්ණ කරන දිනය සියලු ක්‍රියාකාරකම් අවසන් කරන දිනය වනු ඇත.

**3.4** ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගත් ලංසුකරු අධ්‍යක්ෂ, මහ රෝහල, පේරාදෙණිය සමඟ වාර්ෂික කොන්ත්‍රාත්තුව නිසි අයුරින් පවත්වා ගෙන යන බවට ගිවිසුමකට බැඳිය යුතුය. (VII කොටස.01 - ගිවිසුම් පත්‍රය )

**3.5.කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලබන රසායන හා අනෙකුත් ද්‍රව්‍යපිළිබඳ කොන්දේසි**

3.5.1 රසායන ද්‍රව්‍යරසායනික ද්‍රව්‍යසංයුතිය සඳහන් කර ඇති විවෘත නොකරන ලද වෙළඳ පොළ ඇසුරුම් විය යුතුය. තවද, ලංසු දත්ත පත්‍රිකාවේ C කොටසේ ( a - f) යටතේ සඳහන් කරුණු සපුරාලිය යුතුය.

3.5.2 ප්‍රමාණ පත්‍රයෙහි සඳහන් රසායන ද්‍රව්‍ය සඳහා පිරිවැය දක්වන ලේඛනයේ එම රසායන ද්‍රව්‍යයන්හි වෙළඳ නාමය/ වෙළඳ නාමයන් සටහන් කළ යුතුය.

3.5.3 සපයනු ලබන සියලුම රසායනික ද්‍රව්‍ය සඳහා ITI මඟින් හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ලබාගන්නා ලද තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාදිය යුතුයි. එම රසායනික ද්‍රව්‍යවල ප්‍රමිතිය අංක 03 යටතේ දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතුයි.

3.5.4 සපයනු ලබන රසායනික ද්‍රව්‍යවලට අදාළ Material Safety Data Sheets ලබා දිය යුතුය.

3.5.5 කොන්ත්‍රාත් කාලය තුළ සපයනු ලබන රසායනික ද්‍රව්‍ය ලංසු ලියවිල්ල සමඟ ඉදිරිපත් කරනු ලබන ඉහත 3.5.1 මඟින් දක්වා ඇති රසායනික ද්‍රව්‍යම විය යුතුයි.

3.5.6 කොන්ත්‍රාත් කාලය තුළම සැපයිය යුතු වන්නේ ලංසු ලියවිල්ල සමඟ ඉදිරිපත් කරනු ලබන සන්නාම නාමය සඳහන් රසායනික ද්‍රව්‍ය පමණක් වේ.

3.5.7 එක් එක් රෝහල/ආයතනය පිරිසිදු කිරීම සඳහා නියම කර ඇති සංයුතිය පරිදි විෂබීජ නාශක හා රසායන ද්‍රව්‍ය සැපයිය යුතුය.

3.5.8 මාසිකව අවශ්‍ය වන රසායන ද්‍රව්‍ය ප්‍රමාණයන් සෑම මසකම රෝහල මඟින් පූර්වයෙන් නිශ්වය කරනු ලබන දිනයකදී ආසාදන පාලන ඒකකයේ හෙද නිලධාරි/ආසාදන පාලන ඒකකය භාර

නිලධාරියෙකුට/මහජන සෞඛ්‍ය පරීක්ෂකට හෝ ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද නිලධාරියෙකුට ඉදිරිපත් කර එය නිවැරදි බවට ලොග් සටහන් පවත්වා ගත යුතුය.

3.5.9 කොන්ත්‍රාත් ගිවිසුම්ගත වීමට පෙර තෝරාගත් ලංසුකරු විසින් ප්‍රමාණ පත්‍රයෙහි දක්වා ඇති රසායන ද්‍රව්‍යවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා, රෝහල් ආසාදන පාලන ඒකකය වෙත නියැදි (සාම්පල්) පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කළ යුතුය.

## 3.6 Force Majeure

3.6.1 නිර්වචනය

මෙම කොන්ත්‍රාත්තුවේ අරමුණු සඳහා, "Force Majeure" යන්නෙන් අදහස් වන්නේ කොන්ත්‍රාත්තුවක එක් පාර්ශවකරුවෙකුට සාධාරණ පාලනයෙන් ඔබ්බට ගිය සිදුවීමකි. සහ කොන්ත්‍රාත්තුව යටතේ පාර්ශවයක් තම වගකීම ඉටු කළ නොහැකි හෝ යම් තත්වයන් යටතේ කළ නොහැකි යැයි සැළකිය හැකි ප්‍රායෝගික නොවන සිදුවීමකි.

3.6.2 ගිවිසුම් කඩ නොවන අවස්ථා

මෙම කොන්ත්‍රාත්තුවේ නියමයන් සහ කොන්දේසි ක්‍රියාත්මක කිරීම සඳහා සියලු සාධාරණ පූර්වාරක්ෂාවන්,නිසි අයුරින් සහ වගකිවයුතු විකල්ප ක්‍රියාමාර්ග ගෙන ඇති අවස්ථා හා එවැනි සිදුවීම් සිදු වීම පිළිබඳව කලින් අනෙක් පාර්ශවයට දන්වා ඇති අවස්ථාවේදි කොන්ත්‍රාත්තුව යටතේ පාර්ශවයක් තම වගකීම් කිසිවක් ඉටු කිරීමට අපොහොසත් වීම මෙම කොන්ත්‍රාත්තුවේ උල්ලංඝනය කිරීමක් හෝ පැහැර හැරීමක් ලෙස නොසැළකේ.

3.6.3 කාලය දීර්ඝ කිරීම

යම් පාර්ශවයක් මෙම කොන්ත්‍රාත්තුවට අනුකූලව කිසියම් ක්‍රියාවක් හෝ කාර්යයක් සම්පූර්ණ කළ යුතු ඕනෑම කාලසීමාවක් තුළ සාධාරණ පාලනයෙන් ඔබ්බට ගිය සිදුවීමක් නිසා එම පාර්ශවයට එවැනි ක්‍රියාවක් කිරීමට නොහැකි වූ කාලයට සමාන කාලයක් සඳහා කොන්ත්‍රාත්තුව දීර්ඝ කරනු ලැබේ.

3.6.4 ගෙවීම්

සාධාරණ පාලනයෙන් ඔබ්බට ගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සේවා ඉටු කිරීමට ඔවුන්ට නොහැකි වූ කාල සීමාව තුළ සේවා සපයන්නාට මෙම කොන්ත්‍රාත්තුවේ නියමයන් යටතේ දිගටම ගෙවීමට මෙන්ම අමතර වියදම් සඳහා සාධාරණ හා අවශ්‍ය ලෙස ප්‍රතිපූරණය කිරීමට හිමිකම් ඇත.

## 3.7 අවසන් කිරීම

3.7.1 සේවායෝජකයා විසින්

මෙම 3.7.1 වගන්තියේ (අ) සිට (ඊ) දක්වා ඡේදවල ඇති ඕනෑම සිදුවීමක් සිදු වූ පසු සේවායෝජකයා විසින් සේවා සපයන්නා වෙත සේවය අවසන් කිරීම පිළිබඳ දින 30කට නොඅඩු කාලයක් තුළ ලිඛිත දැනුම් දීමකින් මෙම කොන්ත්‍රාත්තුව අවසන් කළ හැකිය.(ඉ) හි සඳහන් සිදුවීම සම්බන්ධයෙන් දින 60ක් තුළ දැනුම් දිය හැක.

(අ) සේවායෝජකයා විසින් ලිඛිතව අනුමත කර ඇති පරිදි දැනුම් දීමෙන් පසු දින 30ක් ඇතුළත හෝ වෙනත් කාලසීමාවක් තුළ සේවා සපයන්නන් කොන්ත්‍රාත්තුව යටතේ ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමේදි අසමත් වීම

(ආ) සේවා සපයන්නා බංකොලොත් වුවහොත්

(ඇ) Force Majeure හි ප්‍රතිඵලයක් ලෙස, සේවා සපයන්නාට දින 60කට නොඅඩු කාලයක් සඳහා

(ඈ) සේවා සපයන්නා විසින් 4.8 වගන්තියට අනුව කාර්ය සාධන සුරක්ෂණයක් ලබා නොදෙන්නේ නම්

(ඉ) සේවා සපයන්නා විසින් 3.8.1 උප වගන්තිය සහ කොන්ත්‍රාත් දත්තවලට අනුකූලව උපරිම ඇවර කළ හානිය ගෙවිය හැකි දින ගණනින් සේවා අවසන් කිරීම ප්‍රමාද කර ඇත්නම්

(ඊ) සේවා යෝජකයා තම අභිමතය පරිදි මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට තීරණය කරන්නේ නම්.

3.7.2 සේවා සපයන්නා විසින්

සේවා සපයන්නා විසින් සේවායෝජකයාට දින තිහකට නොඅඩු ලිඛිත දැනුම්දීමකින් මෙම කොන්ත්‍රාත්තුව අවසන් කළ හැකිය,මෙම 3.7.2 වගන්තියේ (අ) හා (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ඕනෑම සිදුවීමක් සිදු වූ පසු එවැනි දැනුම්දීමක් කළ යුතුය.

(අ) මෙම කොන්ත්‍රාත්තුවට අනුව සේවා සපයන්නාට ගෙවිය යුතු මුදල් ගෙවීමට සේවායෝජකයා අපොහොසත් වන්නේ නම් සහ එම ගෙවීම ප්‍රමාද වී ඇති බවට සේවා සපයන්නාගෙන් ලිඛිත දැනුම්දීමක් ලැබීමෙන් පසු දින 90ක් ඇතුළත 7වැනි වගන්තියට අනුව ආරවුලකට යටත් නොවේනම්, හෝ

(ආ) Force Majeure හි ප්‍රතිඵලයක් ලෙස, සේවා සපයන්නාට දින 56කට නොඅඩු කාලයක් සඳහා සේවාවන්හි ද්‍රව්‍යමය සැපයීමක් ඉටු කිරීමට නොහැකි වීම.

3.7.3 අවසන් කිරීම මත ගෙවීම

3.7.1 හෝ 3.7.2 වගන්තිවලට අනුව මෙම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසු, සේවායෝජකයා විසින් සේවා සපයන්නා වෙත පහත සඳහන් ගෙවීම් කළ යුතුය:

(අ) සේවය අවසන් කිරීමේ දිනට පෙර සතුටුදායක ලෙස ඉටු කරන ලද සේවාවන් සඳහා 6 වන වගන්තිය අනුව කොන්ත්‍රාත් මුදල.

(ආ) 3.7.1 වගන්තියේ අ,ආ,ඇ,ඈ ඡේදවලට අනුව අවසන් කිරීමේ අවස්ථාවක හැර, කොන්ත්‍රාත්තුව කඩිනමින් සහ ක්‍රමානුකූලව අවසන් කිරීම සඳහා කිසියම් සාධාරණ පිරිවැයක් ප්‍රතිපූරණය කිරීම.

**4. සේවා සපයන්නාගේ වගකීම්**

**4.1 පොදු**

සේවා සපයන්නන් සේවායෝජකයාගේ අවශ්‍යතා සහ ක්‍රියාකාරකම් සටහන සලකමින් කඩිසරව , කාර්යක්ෂම සහ ආර්ථිකමය වාසි සහිත ශිල්පීය ක්‍රම භාවිතයෙන් කළමනාකාරීව සුදුසු උසස් තාක්ෂණික සහ ආරක්ෂිත ක්‍රම භාවිත කරමින් සෑම විටම සේවාවන් ඉටු කළ යුතුය.සේවා සපයන්නා, සේවා යෝජකයාගේ උපදේශකයින් ,උප කොන්ත්‍රාත්කරුවන් හෝ ඕනෑම තෙවන පාර්ශවයන් සමඟ විශ්වාසවන්ත හා ගරු කිරීමෙන් යුතුව සේවායෝජකයාගේ නීත්‍යානුකූල අවශ්‍යතා ඉටු කළ යුතුය.

**4.2 රහස්‍යභාවය**

සේවා සපයන්නන්, මෙම කොන්ත්‍රාත්තුව හෝ ඊට අදාළ තොරතුරු සේවායෝජකයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව කොන්ත්‍රාත්තුව කල් පිරී වසර 2ක් ඉකුත් වන තුරු කිසිඳු පාර්ශවයකට හෙළි නොකල යුතුය.

**4.3 සේවා යෝජකයාගේ පූර්ව අනුමැතිය අවශය සේවා සපයන්නාගේ ක්‍රියාවන්**

පහත සඳහන් ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර සේවා සපයන්නන් විසින්, සේවා යෝජකයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය:

(අ) සේවාවේ ඕනෑම කොටසක සේවා සැපයීම සඳහා උප කොන්ත්‍රාත්තුවකට ඇතුලත් වීම

(ඇ) ක්‍රියාකාරකම් සටහන වෙනස් කිරීම, සහ

(ඇ) කොන්ත්‍රාත් දත්තවල සඳහන් කර ඇති වෙනත් ක්‍රියාවක්.

## 4.4 සේවා යෝජකයාගේ දේපළ බවට සේවා සපයන්නන් විසින් සකස් කරන ලද ලේඛන

ඉදිරිපත් කරන ලද සියලුම වාර්තා ,රසායන ද්‍රව්‍යහැර සේවායෝජකයාගේ දේපළ බවට පත්විය යුතු අතර සේවා සපයන්නන් විසින් මෙම කොන්ත්‍රාත්තුවේ සේවය අවසන් කිරීමට හෝ කල් ඉකුත්වීමට පෙර එවැනි ලේඛන පිලිබඳ සවිස්තරාත්මක ඉන්වෙන්ට්‍රියක් සමඟ සේවා යෝජකයා වෙත ලබා දිය යුතුය.

## 4.7.අලාභ හානි ,කොන්දේසි කඩකිරීම් හා අය කිරීම්

4.7.1 නියමිත රසායනික සංයුතිය සඳහන් නොවන හෝ වෙළෙඳපොළ ඇසුරුම නොමැති විෂබීජ නාශක ද්‍රව්‍ය සපයනු ලබන අවස්ථාවන්හි දී එම ද්‍රව්‍ය භාවිතා නොකර රෝහල, සෞඛ්‍ය ආයතනය විසින් එම ද්‍රව්‍යසපයා ගනු ලබන අතර එම ද්‍රව්‍යවලට අදාළ වෙළඳපොළේ පවතින මිල හා 25%ක දෙපාර්තමේන්තු ගාස්තුවක් පිරිසිදු කිරීමේ සේවය සපයනු ලබන ආයතනයට ගෙවන මුදලින් අය කර ගනු ලැබේ.

4.7.2 තෝරාගත් ලංසුකරුගේ සේවා ඉටුකිරීම අසතුටුදායක බව ආයතන ප්‍රධානියාට පෙනී ගියහොත් හෝ කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කුමන හෝ කොන්දේසියක් කඩකර ඇත්නම් හෝ කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධන බැඳුම්කරයේ හිමිකම අහිමි කිරීමටත්, කොන්ත්‍රාත්තුව අවසන් කිරීමටත්, ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ සහිතව සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් වෙත දැනුම් දිය යුතුයි.

4.7.3 මාසිකව අවශ්‍ය වන රසායන ද්‍රව්‍යප්‍රමාණයන් සෑම මසකම රෝහල මඟින් දැනුම්දෙන දිනයේ ආසාදන පාලන ඒකකයේ හෙද නිලධාරි/ආසාදන පාලන ඒකකය භාර නිලධාරියෙකුට/මහජන සෞඛ්‍ය පරීක්ෂකට හෝ ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද නිලධාරියෙකුට ඉදිරිපත් කර එය නිවැරදි බවට ලොග් සටහන් පවත්වා ගත යුතුය. එසේ නොකිරීම වෙනුවෙන් ඒ සඳහා රෝහල/ආයතනයට ඒ වෙනුවෙන් අමතර වියදමක් දැරීමට සිදුවුවහොත් එම මුදල සහ 25% අතිරේක පිරිවැයක්ද අය කිරීමට ආයතන ප්‍රධානියා කටයුතු කරනු ලැබේ.

4.7.4 රෝහල් අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරන පරිදි , භාවිතා කරන රසායන ද්‍රව්‍ය, එකඟ වූ නියමිත ප්‍රමිතිය රසායනික සංයුතිය සහිත රසායන ද්‍රව්‍ය බවට ITI ආයතනය හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙතින් තහවුරු කරවා ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා කටයුතු කරනු ලබන අතර, එලෙස තහවුරු කිරීම සඳහා වන වියදම අවස්ථා 02ක් තුල දී කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතුය. රසායනික ද්‍රව්‍යවල ප්‍රමිතිය තහවුරු කර ගැනීමට නොහැකි වුවහොත් දෙවනුවට අවම මිළ ගණන් සපයා ඇති සැපයුම්කරුගෙන් එම රසායනික ද්‍රව්‍යය සපයා ගැනීමට කටයුතු කරනු ලැබේ. එසේ සපයා ගැනීමේ දී රජයට යම් අමතර වියදමක් දැරීමට සිදුවුව හොත් එම වියදම කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

4.7.5 ඉල්ලුම් කරන ලද ප්‍රමිතිය තුළ සැපයීමට අපොහොසත් වන රසායනික ද්‍රව්‍ය සඳහා එනම්, තත්ත්ව පරීක්ෂණ වාර්තා සඳහා යොමු කරන ලද රසායනික ද්‍රව්‍යවල තත්ත්ව පරීක්ෂණ වාර්තාව අසමත් වන අවස්ථා වලදී එම කාණ්ඩයේ රසායනික ද්‍රව්‍ය සඳහා කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

## 4.8 කාර්ය සාධන සුරක්ෂණය

සේවා සපයන්නා විසින් සේවායෝජකයාට කොන්ත්‍රාත් ලිපියේ දක්වා ඇති දිනට පෙර කාර්ය සාධන සුරක්ෂණය ලබා දිය යුතුය.කාර්යසාධන සුරක්ෂණය සේවායෝජකයාට පිළිගත හැකි මුදලකින් සහ

ආකෘතියකින් සහ බැංකුවක් හෝ ඇපකරයක් මඟින් නිකුත් කරනු ලැබේ.කාර්ය සාධන සුරක්ෂණය කොන්ත්‍රාත්තුව අවසන් වූ දින සිට දින 28 දක්වා වලංගු වේ.

4.8.1 ලංසු ප්‍රදානය ලද කොන්ත්‍රාත්කරු, ලංසු පිළිගැනීමේ ලිපිය ඉදිරිපත් කර දින 14ක් ඇතුළත ලංසුවේ කොන්ත්‍රාත් වටිනාකමින් 10%ක් හෝ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය අනුව දැනුම් දෙනු ලබන වටිනාකමින් යුත් කාර්යසාධන බැඳුම්කරයක්, මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබා ගෙන ඉදිරිපත් කල යුතුය.

4.8.2 සුදුසුකම් ලබා ඇති ලංසුකරු තෝරා ගෙන ගිවිසුම අත්සන් කල පසු අනෙකුත් ලංසුකරුවන්ගේ ලංසු බැඳුම්කර නිදහස් කරනු ලැබේ.

4.8.3 සාර්ථක ලංසුකරුට ලිඛිතව දැනුම් දුන් දින සිට දින 14ක් ඇතුළත එයට සාර්ථක ප්‍රතිචාර නොදක්වන ලද්දේ නම් ඊළඟ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ලබාදීම පිළිබඳව සළකා බැලීමට ප්‍රසම්පාදන කමිටුවට බලය ඇත. ලංසු ප්‍රදානය කිරීමෙන් පසුව සාධාරණ හේතු නොමැතිව එය භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලංසුකරුවන් අසාධු ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන අතර ලංසු ඇපකරය ද රාජසන්තක කරනු ඇත.

## 5. සේවායෝජකයාගේ වගකීම්

### 5.1 සහය සහ නිදහස් කිරීම්

කොන්ත්‍රාත් කොන්දේසි වල නිශ්චිතව දක්වා ඇති පරිදි සේවා සපයන්නාට රජය විසින් ලබා දිය යුතු සහය සහ නිදහස් කිරීම් ලබා දීම සේවායෝජකයා සහතික කළ යුතුය.

### 5.2 සේවා සහ පහසුකම

සේවායෝජකයා විසින් ලැයිස්තුගත කර ඇති සේවා සහ පහසුකම් සේවා සපයන්නා වෙත ලබා දිය යුතුය.

## 6. සේවා සපයන්නා වෙත ගෙවීම්

### 6.1 එකවර ගෙවීම

සේවා සපයන්නාගේ වේතනය කොන්ත්‍රාත්තුවේ මිල නොඉක්මවිය යුතු අතර සියලුම පිරිවැය, විස්තර කර ඇති සේවාවන් ඉටු කිරීමේදී සේවා සපයන්නන් විසින් දරනු ලබන අනෙකුත් සියලුම වියදම් ඇතුළුව ස්ථාවර එකතුවක් විය යුතුය.

**6.2 කොන්ත්‍රාත් මිල** කොන්ත්‍රාත්තුවේ මිල කොන්ත්‍රාත්තුවේ දත්තවල දක්වා ඇත.

### 6.3 ගෙවීම පිළිබඳ නියමයන් සහ කොන්දේසි

සේවා සපයන්නාට ගෙවීම් කරනු ලබන කොන්ත්‍රාත් දත්තවල සඳහන් ගෙවීම් කාලසටහන අනුව කොන්ත්‍රාත් දත්ත වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්,එම මුදලටම බැංකු ඇපකරයක සේවා සපයන්නා විසින් ප්‍රතිපාදන වලට එරෙහිව පළමු ගෙවීම සිදු කරනු ලැබේ. එය කොන්ත්‍රාත් දත්තවල දක්වා ඇති කාලසීමාව සඳහා වලංගු වේ.එවැනි ගෙවීමක් සඳහා කොන්දේසි සපුරාලීමෙන් පසුව වෙනත් ඕනෑම ගෙවීමක් සිදු කළ යුතු අතර, සේවා සපයන්නා විසින් ගෙවිය යුතු මුදල සඳහන් කරමින් සේවායෝජකයා වෙත ඉන්වොයිසයක් ඉදිරිපත් කළ යුතුය.

## 7. ලංසුකරුවන්ගේ මාසික බිල්පත් නිරවුල් කිරීමේදි සළකා බලන කරුණු

7.1 නියමිත ප්‍රමිතියෙන් යුත් උපකරණ හා රසායන ද්‍රව්‍ය භාවිතා කරන බවට ආසාදන පාලන ඒකකයේ ප්‍රධානියාගෙන් හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරන ලද නිලධාරියකුගෙන් ලබාගත් සහතිකය.

7.2 සෑම මසකම 15 වැනි දිනට පෙර ඊට කලින් මාසයට අදාළ බිල්පත් ගෙවීම් බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුවීම. බිල්පත ලබාදී දින 90ක් ඇතුළත ගෙවීම් සිදු කරනු ලබයි. (මෙකී දිනට පසුව ඉදිරිපත් කෙරෙන බිල්පත් ගෙවීම් සම්බන්ධයෙන් ඇති වන ප්‍රමාදයන් සම්බන්ධයෙන් රෝහල් හෝ ආයතන ප්‍රධානීන් වගකීමට බැඳී නොසිටියි.).

7.3 සේවා සඳහා තෝරා ගත් ලංසුකරු හෝ ඔහුගේ සේවකයින් විසින් සේවා සපයනු ලබන ආයතනයට සේවා සැපයීමට අදාළව ගෙවීමට සිදුවන යම් මුදලක් වේ නම්, එම මුදල සේවා සැපයුම්කරු වෙත ගෙවීමට ඇති නියමිත මුදලින් අඩු කර ගැනීමට සේවා ලබන ආයතන ප්‍රධානියාට බලය ඇත.

## 9. ආරවුල් විසඳීම

### 9.1 සුහද විසඳුම්

මෙම කොන්ත්‍රාත්තුව හෝ එහි අර්ථ නිරූපණය සම්බන්ධයෙන් පැන නගින සියලුම ආරවුල් සාමකාමීව විසඳා ගැනීමට පාර්ශවයන් තම උපරිම උත්සාහය භාවිතා කළ යුතුය.

### 9.2 ආරවුල් විසඳීම

සේවා යෝජකයා සහ සේවා සපයන්නා අතර කොන්ත්‍රාත්තුව හෝ සේවා සැපයීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ආරවුලක් සේවා ක්‍රියාත්මක කිරීමේදි හෝ ඒවා අවසන් වූ පසුවද 1995 අංක 11 දරන බේරුම්කරණ පනතට අනුකූලව විසඳනු ලැබේ.

## 10. පොදු කොන්දේසි

10.1 රසායනික ද්‍රව්‍යසැපයීම සඳහා තොරාගන්නා ලද සැපයුම්කරු වෙත භාරදිය යුතු සියළුම දැන්වීම් එවීම පිණිස පිරිසිදු කිරීමේ සේවය නමින් තෝරා ගන්නා ස්ථානය වන කොන්ත්‍රාත් දත්ත 1.4හි සඳහන් සේවා සපයන්නාගේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවුවහොත් ඒවා ඔහුට විධිමත් පරිදි භාරදුන්නා සේ සලකනු ලැබේ. ඉදින් රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා තොරාගන්නා ලද සැපයුම්කරු තම ලිපිනය වෙනස් කළහොත් ඒ බැව් වහාම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ට හා ආයතන ප්‍රධානියාට දැන්විය යුතුය. (කොන්ත්‍රාත් කාල සීමාව තුළ කොන්ත්‍රාත් ආයතනයේ නම වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.)

10.2 රසායනික ද්‍රව්‍යසැපයීම සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතු වූ විට සැපයුම්කරු විසින් ඒ බව ලිඛිත ව හෝ වාචිකව අධ්‍යක්ෂ, මහ රෝහල, පේරාදෙණිය වෙත හෝ බලය පවරා ඇති නිලධාරියෙකුට දැන්විය යුතුය.

10.3 ඉහත කොන්දේසිවලින් ආවරණය නොවුන යම් කරුණක් වේ නම් එය සම්බන්ධයෙන් අවසන් තීරණය පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂ සතුය.

**1. පිරිසිදු කිරීමේ සේවය සඳහා රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම**

**<u>පෞද්ගලික ව්‍යාපාරිකයින් සඳහා</u>**

( අ ) පළමු පාර්ශ්වයකට මින්මතු කොන්ත්‍රාත්කරු යැයි කියනු ලබන (පෞද්ගලික ලිපිනය) ......................................................................................................................ලිපිනයේ පදිංචි (ආයතනයේ ලිපිනය) ......................................................................................................
ස්ථානයේ තම ව්‍යාපාරික කාර්යාලය පවත්වා ගෙන යනු ලබන (කොන්ත්‍රාත්කරුගේ සම්පූර්ණ නම) ......................................................................................................................
කොන්ත්‍රාත්කරු යන පාඨයෙන් එකී(කොන්ත්‍රාත්කරුගේ සම්පූර්ණ නම) ....................................................................................................................... ද (ඔහුගේ උරුමක්කාර, පොල්මක්කාර, අද්මිනිස්ත්‍රාසිකාරයන්ද, හවුල් අයිතිකාරයන්ද අදහස් කෙරෙන අතර එම පාඨයට ඒ සියළු දෙනාම ඇතුළත් වන්නාහ) ද

**<u>සීමාසහිත පෞද්ගලික සමාගම් සඳහා,</u>**

( ආ ) එක් පාර්ශ්වයකට මින්මතු කොන්ත්‍රාත්කරු යයි කියනු ලබන 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව ......................................................... යටතේ ලියාපදිංචි කරන ලද (ආයතනයේ ලිපිනය) ......................................................................... ලිපිනය දරණ ස්ථානයේ තම ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යනු ලබන ( ආයතනයේ නම ) ........................................................................... (කොන්ත්‍රාත්කරු යන පාඨයෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වරින් වර පත්වන අධ්‍යක්ෂවරු ද අදහස් කෙරෙන අතර, ඒ පාඨයට ඒ සියළු දෙනාම ඇතුළත් වන්නාහ) ද
මෙහි මින්මතු දෙවන පාර්ශ්වය යැයි කියනු ලබන පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂ වන ( සම්පූර්ණ නම)…………………………………………………………………………………………
2026 පිරිසිදු කිරීමේ සේවය සඳහා රසායනික රසායනික ද්‍රව්‍ය සැපයීමට අදාළ ලංසු අයදුම්පතට අනුව, .................................. පිරිසිදු කිරීමේ සේවයේ රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ............................ දිනැති ලිපිය මඟින් පළමු පාර්ශ්වය වෙත ලංසුව ප්‍රදානය කළ බවද , එකී ලංසු ප්‍රදානය කිරීමේ ලිපිය මෙම ගිවිසුමේ කොටසක් ලෙස සැළකිය යුතු බවටද,
ඉහත කොන්ත්‍රාත්කරු යැයි කියනු ලබන ( කොන්ත්‍රාත්කරුගේ නම හෝ ආයතනයේ නම ) .................................................. දෙවන පාර්ශ්වය යැයි කියනු ලබන (පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂගේ නම) ……………………………………………………, යන ලිපිනයෙහි වූ ( ආයතනයේ/රෝහලේ නම) ................................................................................................ පිරිසිදු කිරීමේ සේවය සැපයීම සඳහා ඒ වෙනුවෙන් සේවයේ යොදවනු ලබන දිනකට පැය 09 වැඩ පරීක්ෂකවරුන් .............. ක් ද, දිනකට පැය 09 කම්කරුවන් .................. ක් ද නියමිතවැඩ පරීක්ෂකයින් සඳහා (පැය 09) සම්පූර්ණ වාර්ෂික වියදම (දින 365) ...................................................ක් ද නියමිත කම්කරුවන් සඳහා (පැය 09) සම්පූර්ණ වාර්ෂික වියදම (දින 365)..................................................ක් ද යටත්ව වැඩ පරීක්ෂකයින් සඳහා වාර්ෂික අතිකාල පැය ................. ක් ද කම්කරුවන් සඳහා වාර්ෂික අතිකාල පැය ................... ක් ද, පැය 09 නියමිත වැඩ පරීක්ෂකයින් සඳහා අතිකාල වියදම (වාර්ෂික) (දින 365) ......................ක් ද, , පැය 09ක කම්කරුවෙකු සඳහා අතිකාල වියදම (වාර්ෂික) (දින 365) ....................ක් ද, වැටුප් සහ අතිකාල සඳහා මුළු වියදම වූ ............................................ක් ද, පිරිසිදු කිරීමේ ද්‍රව්‍යසඳහා වාර්ෂික පිරිවැය වෙනුවෙන් වූ .................................................................ක් ද, පොදු කාර්යය පිරිවැය සඳහා ............................................ක් ද වශයෙන් වාර්ෂික මුළු පිරිවැය රු. ...............................................ක (බදු රහිත) පිරිවැයකට ද නීතිමය ප්‍රතිපාදනයක් මඟින් වැඩි විය හැකි

ශ්‍රම පිරිවැය හැර වෙනත් කිසිම වියදමක් ...................................... දින සිට .................................... දින දක්වා වූ කාලය තුල වැඩි නොකිරීමට එකඟව ඉහත ආයතනයට පිරිසිදු කිරීමේ සේවය සැපයීමට බැඳී සිටියි. ඉහත සඳහන් ගිවිසුම ............................ දින සිට ........................... දින දක්වා වූ කාලය කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාල පරිච්ඡේදය ලෙස සලකනු ලබන බවටද ............................. දින සිට කොන්ත්‍රාත්වේ ගිවිසුම් කාලය දීර්ඝ නොකරනු ලැබුවහොත් හෝ සාධාරණ හා නීත්‍යානුකූල හේතුන් මත අවසන් කරනු ලැබුවහොත් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් හා කොන්ත්‍රාත්කරු අතර ගිවිසුම අවසන් වූ සේ සළකා කටයුතු කිරීමට ඉහත දෙපාර්ශවය බැඳී සිටියි. තවද රු. .............................................ක් වූ කාර්ය සාධන බැඳුම්කරයකට බැඳී සිටියි.

**<u>ගිවිසුම් ගත වන කොන්දේසි.</u>**

01. පහත සඳහන් ලේඛන මෙම ගිවිසුමට අයත් නීත්‍යානුකූල ලේඛන ලෙස පිළිගන්නා බවට ද,

a) කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය
b) කොන්ත්‍රාත්තුව පිළිගැනීමේ ලිපිය
c) කාර්යසාධන සුරක්ෂණය
d) ලංසු අයදුම් පත්‍රය
e) ලංසුකරුගේ ප්‍රකාශය
f) ලංසු කොන්දේසි
g) කොන්ත්‍රාත් කොන්දේසි
h) කොන්ත්‍රාත් දත්ත

02. තෝරා ගත් ලංසුකරුගේ සේවා ඉටු කිරීම අසතුටුදායක බව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ට පෙනී ගියහොත් හෝ කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කුමන හෝ කොන්දේසියක් කඩකර ඇත්නම් ඔහුට එම කාර්යසාධන බැඳුම්කරයේ හිමිකම අහිමි කිරීමට ද, තවද කොන්ත්‍රාත්තුව ද අවසන් කිරීමට ද, කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කිරීමටද, **පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂට** බලය ඇති බවද, කොන්ත්‍රාත්කරු එයට යටත් වන බවද, එයට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටින බවට ද,

03. එසේම පිරිසිදු කිරීමේ සේවාවට අයහපත් ලෙස බලපාන වෙනත් කරුණක් අනුව, කොන්ත්‍රාත්තුව කඩකිරීම් සම්බන්ධයෙන් ගනු ලබන වෙනත් ප්‍රතිකර්මයකට අගතියක් නොවන අයුරින් කොන්ත්‍රාත්තුව මුළුමනින්ම හෝ එහි කොටසක් වශයෙන් හෝ අවසන් කිරීමටත් **පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂට** බලය ඇති බවද,

04. නව කොන්ත්‍රාත්කරුවෙක් තෝරා ගන්නා තෙක් අවශ්‍ය වන්නේ නම් **පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂගේ** එකඟතාවය ඇතිව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට සේවයේ නියුතු කොන්ත්‍රාත්කරුගේ ගිවිසුමේ නියම කර ඇති කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීමට බලය ඇත. එසේ කොන්ත්‍රාත්තුව දීර්ඝ කොට සේවයේ නිරත කරවනු ලබන කොන්ත්‍රාත්කරු මෙම ගිවිසුමට අනුකූලව තම සේවා කටයුතු පවත්වා ගෙන යාමට බැඳී සිටින බවද,

05. කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පිළිබඳව මනා අවබෝධයක් ලබාගත යුතු බවද, තොරතුරු නොදැන සිටීම සම්බන්ධයෙන් කරනු ලබන කිසිදු ඉල්ලීමක් පිළිගනු ලැබීමට **පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂ** බැඳී නොසිටින බවද,

06. තවද ලංසු අයදුම් පත්‍රය සඳහන් සේවාවන් වෙනත් ආකාරයකින් ලබා ගැනීම පිණිස වෙනත් වැඩ පිළිවෙලක් යෙදීම වඩා යෝග යැයි සිතන්නේ නම් මෙම ගිවිසුම නොසළකා එසේ කිරීමට **පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂට** බලය ඇති අතර, මෙවැනි අවස්ථාවලදී **පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂ** වෙතින් අලාභ ඉල්ලා සිටීමට කොන්ත්‍රාත්කරුට අයිතියක් නොමැති බව කොන්ත්‍රාත්කරු පිළිගත යුතු බවද,

07. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතු වන බදු ගෙවීමට කොන්ත්‍රාත්කරු යටත් වන බවද,

**08. කොන්ත්‍රාත්කරුගෙන් අය කිරීම.**

8.1 මාසිකව අවශ්‍ය රසායන ද්‍රව්‍යප්‍රමාණයන් සෑම මසකම රෝහල මඟින් දැනුම් දෙන දිනයේ ආසාදන පාලන ඒකකයේ හෙද නිලධාරි/ආසාදන පාලන ඒකකය භාර නිලධාරියෙකුට/ආසාදන පාලන ඒකකයක් නොමැති ආයතන සඳහා එම ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද නිලධාරියෙකුට ඉදිරිපත් කර එය නිවැරදි බවට ලොග් සටහන් පවත්වා ගත යුතුය. එසේ නොකිරීම වෙනුවෙන් ඒ සඳහා රෝහල/ආයතනයට ඒ වෙනුවෙන් අමතර වියදමක් දැරීමට සිදුවුවහොත් එම මුදල සහ 25% දෙපාර්තමේන්තු ගාස්තුවක් ද අය කිරීමට ආයතන ප්‍රධානියා කටයුතු කරනු ලැබේ.

8.2 රෝහල් අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරන පරිදි, භාවිතා කරන රසායන ද්‍රව්‍ය, එකඟ වූ නියමිත ප්‍රමිතිය රසායනික සංයුතිය සහිත රසායන ද්‍රව්‍ය බවට ITI ආයතනය හෝ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙතින් තහවුරු කරවා ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා කටයුතු කරනු ලබන අතර, එලෙස තහවුරු කිරීම සඳහා වන වියදම කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතුය. රසායනික ද්‍රව්‍යවල ප්‍රමිතිය තහවුරු කර ගැනීමට නොහැකි වුවහොත් දෙවනුවට අවම මිළ ගණන් සපයා ඇති සැපයුම්කරුගෙන් එම රසායනික ද්‍රව්‍යය සපයා ගැනීමට කටයුතු කරනු ලැබේ. එසේ සපයා ගැනීමේ දී රජයට යම් අමතර වියදමක් දැරීමට සිදුවුව හොත් එම වියදම කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

8.3 ඉල්ලුම් කරන ලද ප්‍රමිතිය තුළ සැපයීමට අපොහොසත් වන රසායනික ද්‍රව්‍ය සඳහා එනම්, තත්ත්ව පරීක්ෂණ වාර්තා සඳහා යොමු කරන ලද රසායනික ද්‍රව්‍යවල තත්ත්ව පරීක්ෂණ වාර්තාව අසමත් වන අවස්ථා වලදී එම රසායනික ද්‍රව්‍ය සඳහා කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

9. තවද පළමු පාර්ශවය විසින් මින්මතු එකී ප්‍රසම්පාදන කොන්දේසි සහ ලංසු ප්‍රදානයේ සියළුම නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටින බවටද, ප්‍රසම්පාදන කොන්දේසි මෙම ගිවිසුමේ කොටසක් ලෙස සැලකිය යුතු බව දෙපාර්ශ්වය විසින් පිළිගනී.

තවද ලංසු ප්‍රදානයේ සඳහන් කර ඇති පරිදි අදාළ කාර්යසාධන ඇපකරය නියමිත කාලය තුලදී (දින 10 ඇතුළත) ඉදිරිපත් කළ යුතු අතර, එය නියමිත කාල සීමාව තුලදී ඉදිරිපත් නොකොට ලංසු ප්‍රදානයේ දින සිට අදාළ සේවා සැපයීම් සිදු කර ඇති විටකදී ඊට අදාළ ගෙවීම් දෙවන පාර්ශවය විසින් සිදු කෙරෙනුයේ අදාළ කාර්ය සාධන ඇපකරය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව බව පළමු පාර්ශ්වය පිළිගත යුතු බවද,

10. ප්‍රසම්පාදන කොන්දේසි හා ගිවිසුම් අතර යම් ගැටළුවක් පැන නැඟුනහොත් එහි දී මෙම ගිවිසුම බල පැවැත්වෙන බවටද,

11. ඉහත කී රෙගුලාසිවලට අමතරව ප්‍රසම්පාදන කමිටුව විසින් හෝ අභියාචනා සළකා බලන අවස්ථාවේ දී ප්‍රසම්පාදන අභියාචන කමිටුව විසින් පනවනු ලබන කොන්දේසි ගිවිසුමෙහි කොටසක් ලෙස පිළිගැනෙන අතර එම කොන්දේසිවලට කොන්ත්‍රාත්කරු බැඳී සිටිය යුතු බවද, ඉහත කී රෙගුලාසිවලට අමතරව ක්‍රියාත්මක විය යුතු රෙගුලාසි පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂ විසින් වරින්වර නිකුත් කරනු ලබන අතර එකී රෙගුලාසි පිළිපැදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටිය යුතු බවටද,

12. මෙහි සඳහන් කොට ඇත්තා වූ කොන්දේසිවලින් ආවරණය නොවුන යම් කරුණක් වේ නම් එය පේරාදෙණිය මහ රෝහල් අධ්‍යක්ෂගේ අභිමතය පරිදි තීරණය වන බවටද, ඉහත කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් සියළුම උපදෙස් හා කොන්දේසි කියවා තේරුම් ගෙන එම කොන්දේසි පරිපූර්ණව හා නොඅඩුව ඉටු කරන බවට එකඟව හා බැඳී දෙපාර්ශවය එයට 2025....................... දින "මහ රෝහල, පේරාදෙණියේ දී" අත්සන් තබන ලදී.

............................................................
............................................................
අධ්‍යක්ෂ, මහ රෝහල, පේරාදෙණිය

නිල මුද්‍රාව

සාක්ෂි :-

01.අත්සන:……………………………
නම ……………………………………………
ලිපිනය ……………………………………..
…………………………..………………
ජා.හැ.අං……………………………………….

02.අත්සන :………………………………
නම ……………………………………………
ලිපිනය ……………………………………..
…………………………..………………
…………………………..………………
ජා.හැ.අං……………………………………….

............................................................
............................................................
ආයතනයේ අයිතිකරු/ අයිතිකරුවන් වෙනුවෙන්/
සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ

නිල මුද්‍රාව

සාක්ෂි:-

01.අත්සන:……………………………
නම ……………………………………………
ලිපිනය ……………………………………..
…………………………..………………
ජා.හැ.අං……………………………………….

02.අත්සන :………………………………
නම ……………………………………………
ලිපිනය ……………………………………..
…………………………..………………
…………………………..………………
ජා.හැ.අං……………………………………….

**2.කාර්ය සාධන සුරක්ෂණය**

**ACCEPTABLE FORMAT FOR PERFORMANCE GUARANTEE**

…………………………………………………………………………………………………
………………………………………………………………………………. [*Issuing Agency's Name and address of issuing branch or office*] …………………………………..

**Beneficiary**: …………………………………. [*Name & Address of Employer*] ............……………

**Date**: ……………………………………………….

**PERFORMANCE GUARANTEE/ SECURITY NO**: …………………………………………………………………………………………………
.

We have been informed that ………………………………………… [*Name of the contractor / Supplier*] (Hereinafter called "the contractor") has entered into contract NO. ……………………………………………. [*Reference number of the contract*] dated ……………………………………with you, for the …………………………[*Insert "Construction / Supply"*] of ………………………………………… [*Name of contract and brief description of works or supply*] (Hereinafter called "the contract")

Furthermore, we understand that, according to the conditions of the contract, a performance guarantee is required.

At the request of the contractor, we …………………………………………………[*name of Agency*] here by irrevocably undertake to pay you any sum or sums not exceeding in total amount of ……………………..................................................................................................[*Amount in figures*] (……………………………………………………………)[*Amount in words*]

such sum being payable in the types and proportions of currencies in which the contract price is payable, upon receipt by us of your first demand in writing accompanied by a written statement stating that the contractor is in breach of its obligations (s) under the contract, without your needing to prove or to show grounds for your demand or the sum specified therein.

This guarantee shall expire, no later than the ……………………………………………… day of ……………………………20 ……….... [*Insert date, 28 days beyond the schedule contract completion date*] and any demand for payment under it must be received by us at this office on or before that date.

………………………………………………………………………………….

[Signature (s)]

**ලංසු දැන්වීම**

**පේරාදෙණිය මහ රෝහල**
**ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම- 2025/2026**

2025/2026 වර්ෂයක කාලයක් සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති පහත සඳහන් රෝහල් හා ආයතනවල පිරිසිදු කිරීමේ සේවය සැපයීම පිණිස ලියාපදිංචි ආයතනවලින් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

**1. මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතුය.**

I. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත යටතේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස පුවත්පත් දැන්වීම පළ වූ දිනට අවම වශයෙන් වර්ෂයකට පෙර ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

II. පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය (ඒ ඒ රෝහල් /ආයතනය සඳහා වෙන වෙනම ලියාපදිංචි සහතික ඉදිරිපත් කළ යුතුය)

III. වැට් බදු ගෙවන්නේ නම් පූර්වාසන්න තක්සේරු වර්ෂය සඳහා ආයතනය නමින් වැට් බදු/ආදායම් බදු ගෙවා ඇති බව ලිඛිත සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය. (සී/ස සමාගමක් නම් සමාගම නමින් ද, තනි පුද්ගල /හවුල් ව්‍යාපාර ආයතන සියළු හවුල්කරුවන්ගේ නමින් ද, පූර්වාසන්න වර්ෂය සඳහා ආදායම් බදු, වැට් බදු ගෙවා ඇති බවට ලිඛිත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

IV. ලංසුකරු නිෂ්පාදකයකු නොවන්නේ නම් ඒම නිෂ්පාදකයාගේ වෙළද නියෝජිතයකු බවට ලංසුකරු පිළිගන්නා බවට වු සහතිකය ඉදිරිපත් කල යුතුය.

V. වරලත් විගණන ආයතනයකින්, ආයතනයේ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශන (පූර්වාසන්න වසර දෙකකින් එක් වර්ෂයකට අදාළව)

VI. GMP (Good Manufacturing Practices) සහතිකය තිබිය යුතුය.

VII. පහත වගුවේ සඳහන් පරිදි රෝහල්/ආයතන වලට අදාළ වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් මහ රෝහල, පේරාදෙණිය ලිපිනයෙහි වූ **අධ්‍යක්ෂ,** නමට ලියන ලද, ලංසු භාර ගැනීම අවසන් වූ දින සිට දින 119 ක කාලයකට වලංගු වන සේ ලබාගත් ලංසු බැඳුම්කරයක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. **(2025.11.07 දින සිට 2026.03.05** දින දක්වා වලංගු විය යුතුය).

**2.** ලංසු ලේඛන ගාස්තුව ලෙස රු. 2,000.00 ක ආපසු නොගෙවන මුදලක් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සරප් වෙත ගෙවිය යුතු හෝ මහජන බැංකුවේ රෝහල් ගිණුමේ අංක 057100129025207 හි තැන්පත් කළ යුතුය. අදාළ රිසිට්පත ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතුය. ලංසු ලේඛන 2025 ඔක්තෝම්බර් 23 වන දින සිට පේරාදෙණිය මහ රෝහලේ නිල වෙබ් අඩවියෙන් (www.peradeniya-hospital.health.gov.lk ) බාගත කර පරීක්ෂා කළ හැකිය.

**ආයතනය/රෝහල**

| අනු අං කය | රෝහලේ නම | ප්‍රසම්පාදන අංකය | ලංසු ඇපකරය (රු.) | ලංසු ලියවිලි ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| **01** | මහ රෝහල, පේරාදෙණිය | THP/AB/10/2025 | 120,000.00 | 2000.00 |

3. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි 2025.11.07 දින **පෙ.ව. 10.30** ට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, මහ රෝහල, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පේරාදෙණිය මහ රෝහලේ ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ භාරදීමට කටයුතු කළ යුතුය. ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “2025/2026 වර්ෂයේ පේරාදෙණිය මහ රෝහලේ පිරිසිදු කිරීමේ සේවාව සඳහා අවශ්‍ය වන සේදුම්කාරක හා විශබීජ නාශක රසායනික ද්‍රව්‍යමිළ දී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු සපයා ගැනීම” යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

5. **2025.11.07** දින **පෙ.ව. 10.30 දක්වා** පේරාදෙණිය මහ රෝහලේ දී ලංසු භාරගැනීම සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට පේරාදෙණිය මහ රෝහලේ අධ්‍යක්ෂගෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය. (දුරකථන: 081-3880001)

6. පූර්ව ලංසු රැස්වීම 2025.10.29 **දින පෙ.ව 11.00** ට පේරාදෙණිය මහ රෝහලේ දී පැවැත්වේ

7. ඉදිරිපත් වන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,

ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,

මහ රෝහල,

පේරාදෙණිය.

**04.කොන්ත්‍රාත් ප්‍රදාන ලිපියේ ආකෘතිය**

……………………

……………………

…………………….

**පිරිසිදු කිරිමේ සේවාව සඳහා** අවශ්‍ය වන සේදුම්කාරක හා විශබීජ නාශක රසායනික ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු සපයා ගැනීම **- 2025/2026**

මහ රෝහල, පේරාදෙණිය

ඔබ ආයතනය විසින් ඉහත සේවාව සඳහා ඉදිරිපත් කරන ලද ලංසු අයදුම්පතට අනුව …………………දින සිට ………………… දින දක්වා වසරක කාලයකට ඉහත ආයතනයේ පිරිසිදු කිරීමේ සේවය සඳහා අවශ්‍ය වන සේදුම්කාරක හා විශබීජ නාශක රසායනික ද්‍රව්‍යමිළ දී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු සපයා ගැනීම සඳහා වන කොන්ත්‍රාත්තුව ඔබ ආයතනය වෙත පැවරිමට …………………….. දින රැස්වූ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව තිරණය කර ඇති බව කාරුණිකව දන්වමි.

02. ඒ අනුව පහත සඳහන් මිළගණන් යටතේ මෙම කොන්ත්‍රාත්තුව ඔබ ආයතනය වෙත පවරමි.

| අනු අංකය | රසායනික ද්‍රව්‍යය | වෙළඳ නාමය/ සන්නාම නාමය | ඒකකය | ඒකක ගණන (වාර්ෂික) | ඒකකයක මිළ | මුළු මිළ |
|---|---|---|---|---|---|---|
| 01 | Multi-Purpose Cleaner/ Liquid Detergent | | Litre | 4,200 | | |
| 02 | හයිඩ්‍රොක්ලෝරින්/ෆයිනෝල්/ ෆීනෝල් | | Litre | 3,600 | | |
| 03 | ග්ලාස් ක්ලිනර් (Glass Cleaner) | | Litre | 60 | | |
| 04 | බ්ලිජින් පවුඩර් (Bleaching Powder | | Litre | 180 | | |
| 05 | සුවඳ දියර/එයාර් ෆ්‍රෙෂ්නර් | | Litre | 1,200 | | |
| 06 | ටයිල් ක්ලීනර් | | Litre | 96 | | |
| 07 | Toilet Bowl Cleaner | | Litre | 2,400 | | |
| 08 | මොත් බෝල් (Moth Ball) | | 500mg පැකට් | 12 | | |
| 09 | සුවඳ කැට | | කැට | 120 | | |

| | මුළු මුදල | | | | | |
|---|---|---|---|---|---|---|

03. සැපයිය යුතු රසායනික ද්‍රව්‍යයන් විවෘත නොකරන ලද වෙළෙඳ පොල ඇසුරුම් විය යුතු අතර, ආසාදන පාලන ඒකකයේ ප්‍රධානියා වෙත ඒවා දෛනිකව ඉදිරිපත් කර යෙදිය යුතු ප්‍රමාණය හා සංයුතිය (පරිමා/බර) තහවුරු කර ගත යුතුය. තවද පිරිසිදු කිරීමේ සේවය පිළිබඳ ප්‍රගතිය ආයතන ප්‍රධානියා විසින් මාසිකව සමාලෝචන කළ යුතු බවට හා ලංසු කොන්දේසි අංක අනුව කොන්ත්‍රාත්කරු වශයෙන් ඔබ ආයතනය නියමිත ප්‍රමිතියට අනුකූලව රසායන ද්‍රව්‍යසපයනු ලබන බවට රෝහල් පරිපාලනය වරින් වර අවස්ථානුකූලව තහවුරු කරගත යුතු බවද ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදී.

**04. ප්‍රසම්පාදන තීරණ හා කොන්දේසි**

I. රසායනික ද්‍රව්‍යයන් විවෘත නොකරන ලද වෙළඳපොළ ඇසුරුම් විය යුතු අතර, ලංසු ලේඛනයේ සඳහන් රසායන ද්‍රව්‍ය වර්ගයන් හා ප්‍රමිතීන් එම වෙළඳ නාමයන් හා ප්‍රමිතීන් යටතේම තිබිය යුතු අතර, ආසාදන පාලන ඒකකයේ ප්‍රධානියා වෙත ඒවා දෛනිකව ඉදිරිපත් කර යෙදිය යුතු ප්‍රමාණය හා සංයුතිය (පරිමා/බර) තහවුරු කර ගත යුතු බවට ද, පිරිසිදු කිරීමේ සේවය පිළිබඳ ප්‍රගතිය රෝහල් අධ්‍යක්ෂ විසින් මාසිකව සමාලෝචනය කළ යුතු බවටද, එසේ නොමැති නම් අඩුවෙන් සපයන ප්‍රමාණයට අදාල වටිනාකම කොන්ත්‍රාත්කරුගේ බිලෙන් අඩු කළ යුතු අතර මීට අමතරව ලංසු ලේඛනයේ ලංසු කොන්දේසි අංක 4.7.1 හා 4.7.3 අනුව කටයුතු කළ යුතු බවට ද,

II. පිරිසිදු කිරීමේ සේවය සැපයීමට අදාල වාර්ෂික රසායනික ද්‍රව්‍යප්‍රමාණය නිසි පරිදි මාසික අවශ්‍යතාවය අනුව සපයන්නේද යන්න පිළිබඳව රෝහල් පරිපාලනය විසින් පරීක්ෂා කර බලා ඒ පිළිබඳව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයීම්) වෙත වාර්තා කළ යුතු අතර, සපයනු ලබන රසායන ද්‍රව්‍යන්හි නියමිත ප්‍රමිතිය තහවුරු කිරිම සඳහා අදාළ ලේඛන රෝහල් වෙත ඉදිරිපත් කළ යුතු බවටද,

III. මෙම ප්‍රසම්පාදන තීරණයෙන් ලබා දෙන කොන්දේසි හා නියෝග කොන්ත්‍රාත්කරු සමඟ එළඹෙන ගිවිසුමේ කොටසක් ලෙස සැලකිය යුතු බවට හා මෙම කොන්දේසි ගිවිසුමට ඇතුලත් කරන බවටද,

IV. ලංසු කොන්දේසි අංක අනුව කොන්ත්‍රාත්කරු විසින් නියමිත ප්‍රමිතියට අනුකූලව රසායනික ද්‍රව්‍යසපයනු ලබන බවට රෝහල් පරිපාලනය විසින් තහවුරු කර ගත යුතු වන අතර සැපයීම් තුලදී ද අවස්ථානුකූලව ප්‍රමිතිය පිළිබඳ තහවුරු කර ගැනීමක් වරින් වර සිදුකළ යුතු බවටද,

05. ඉහත පරිදි කොන්ත්‍රාත්තුව භාර ගැනීමට ඔබ එකඟ වන්නේ නම් වාර්ෂික කොන්ත්‍රාත් මුදලින් 10% වන රු.................. ක මුදලක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති බැංකුවකින් …………………… දින සිට ………………… දක්වා කාලයකට වලංගු වන සේ අධ්‍යක්ෂ, මහ රෝහල, පේරාදෙණිය නමින් කාර්ය සාධන ඇපකරයක් දින 14 ඇතුලත ඉදිරිපත් කර, අධ්‍යක්ෂ, මහ රෝහල, පේරාදෙණිය සමඟ සේවා ගිවිසුම අත්සන් කල යුතුය.

06. එකී කොන්ත්‍රාත්තුව, ගිවිසුම අත්සන් කරන තෙක් ලංසු අයදුම්පතේ දක්වා ඇති කොන්දේසි, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත ලිය කියවිලි ලෙස සැලකිය යුතුය.

ඉහත කොන්දේසි වලට යටත්ව මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමට ඔබ ආයතනය එකඟ වන්නේ නම්,මේ සමඟ අමුණා ඇති ලිපියේ අනු පිටපත අත්සන් කර මා වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙයට විශ්වාසී,

………………………………..

අධ්‍යක්ෂ,

මහ රෝහල, පේරාදෙණිය

ඉහත කොන්දේසි වලට යටත්ව උක්ත කොන්ත්‍රාත්තුව භාර ගැනීමට එකඟ වෙමි.

කොන්ත්‍රාත්තුවේ නම : ..........................................................................

දිනය .......................................          කොන්ත්‍රාත්කරුගේ අත්සන ..................................

පිටපත්

1. විගණකාධිපති, අ.ක.ස
   විගණකාධිපති දෙපාර්තමේන්තුව.
2. දේශිය ආදායම් කොමසාරිස්, අ.ක.ස.
   දේශිය ආදායම් දෙපාර්තමේන්තුව.
3. අතිරේක ලේකම් (ප්‍රසම්පාදන), අ.ක.ස.
   සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.
4. කම්කරු කොමසාරිස්,
   ශ්‍රම ප්‍රමිති අංශය,
   කම්කරු දෙපාර්තමේන්තුව,
   කොළඹ -05.
5. ……………………
   …………………….
   …………………….